# මිහින්තලේ ආරාම සංකීර්ණය ආශ්‍රිත නිර්මාණකරණය සඳහා භාවිත පාෂාණ වර්ග

## දීර්ඝ සාරාංශය

එම්.පී.චන්දිමා සඳමාලි [1], නිමේෂා නිල්මිණි තෙන්නකෝන්

### හැඳින්වීම

පාෂාණ අර්ථ දැක්වීමේ දී විවිධ ක්ෂේත්‍ර එකිනෙක වෙනස් අර්ථ නිරූපණ ලබා දේ. ඉංජිනේරු විද්‍යාවේ දී එය හඳුන්වා ඇත්තේ ශක්තිමත් එමෙන් ම ඝන ද්‍රව්‍ය පාෂාණ ලෙස ය. භූ විද්‍යාවට අනුව පාෂාණ යනු පෘථිවි පෘෂ්ඨයට අයත් ස්වභාවික නිර්මාණය වූ සමූහ හෝ ඛනිජ ද්‍රව්‍යවලින් සැදුම්ලත් ස්කන්ධයන් ය. ඒ නිසා පාෂාණ සංයුක්ත වී ඇත්තේ ඛනිජවලින් බව පැහැදිලි ය. එය තනි ඛනිජයකින් හෝ ඛනිජ වර්ග කිහිපයකින් විය හැකි ය. විශේෂයෙන් ම ස්මාරක, අලංකරණ අංග ආදිය නිර්මාණයේ දී පාෂාණයක පවත්නා ඛණිජ සංයුතියත් ඒවායේ ගුණ වශයෙන් හඳුනාගෙන ඇති වර්ණය, ලේඛාව, දැඩියාව, දීප්තිය, පැළුම් තල මෙන් ම විශිෂ්ට ගුරුත්වය යන කරුණු ඉතා වැදගත් වේ. මිහින්තලය භූ විද්‍යාත්මක වශයෙන් සැලකීමේ දී එය ශේෂ කන්දකි. පාෂාණමය නිර්මාණ සිදුකිරීමේ දී මුල් පාෂාණය භාවිත කිරීම සිදු විය. මිහින්තලයෙහි දැක ගත හැකි පාෂාණ භූ විද්‍යාත්මක වන්නි සංකීර්ණයට අයත්වේ. මෙහි පාෂාණ ආශ්‍රිත නිර්මාණ සිදු කිරීමේ දී විපරීත පාෂාණ යොදාගෙන ඇත. ඒ අතර යොදාගෙන තිබෙන පාෂාණ වර්ග වන්නේ, චානොකයිට්බයෝටයිට්නයිස් (Charnochitic biotite Gneiss), ග්‍රැනටික්නයිස් (Granitic gneiss), හොන්බ්ලෙන්බයෝටයිට්නයිස් (Hornblende biotitic gneiss) සහ මා(ර්)බල් (Impure marble and dolomite marble) යි.

### ක්‍රමවේදය

අධ්‍යයන ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර ගවේෂණයක් සිදු කරන ලදි. එමෙන් ම සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය මඟින් දත්ත රැස්කර ගන්නා ලදි. වර්තමානයේ පුරාවිද්‍යාභූමිය තුළ දක්නට ලැබෙන පාෂාණමය ඉදිකිරීම් හඳුනා ගැනීම හා උපයෝගී කරගත් පාෂණ මොනවා ද යන්නත් ඒවා උපයෝගී කරගැනීමට පාදක වූ ගුණ කවරේ ද යන්නත් මෙම ක්‍රමවේද ඔස්සේ හඳුනා ගන්නා ලදි.

### ප්‍රතිඵල සාකච්ඡාව

මිහින්තලේ පුරාවිද්‍යා භූමිය තුළ ප්‍රධාන වශයෙන් හඳුනා ගත් පාෂණ නිර්මාණ ලෙස ලෙන් ලිපි, පර්වත ලිපි, ටැම් ලිපි, පුවරු ලිපි, නාග පොකුණ, කළුදිය

පොකුණ, සිංහ පොකුණ, පැරණි වෙදහල, දාන ශාලාව,සන්නිපාත ශාලාව, පිරිවෙන් හා පිළිමගෙය, වාහල්කඩ කැටයම්, හිටි බුද්ධ ප්‍රතිමාව, සිංහ පොකුණේ කැටයම්, ගොඩනැඟිලි අලංකාර කැටයම්, පියගැට පෙළ හා මිහිඳු ගුහාව හඳුනාගත හැකි ය. ශිලා ලේඛන පිළිබඳව සැලකීමේ දී මිහින්තලයේ ලෙන් ලිපි, පර්වත ලිපි, පුවරු ලිපි, ටැම් ලිපි ලෙස විවිධ ස්වරූපයෙන් හමු වී ඇත. ලෙන් ආශ්‍රිතව හමු වී ඇති ලිපි 106කට අධික වේ. මෙම ලෙන් ලිපි කොටා ඇත්තේ නයිස් පාෂාණයේ ය. විශේෂත්වය වන්නේ නයිස් පාෂාණයේ ස්ඵටික කුඩා වීම මත අක්ෂර කෙටීමේ පහසුව යි.

මිහින්තලේ පූජනීය සහ අර්ධ පූජනීය ගොඩනැඟිලිවලට පිවිසීමේ දී දැකිය හැකි අලංකරණ අංගවන සඳකඩ පහන්, මුරගල්, කොරවක්ගල් වේ. මේවා සඳහා ද භාවිත කර ඇත්තේ නයිස් පාෂාණය යි. විශේෂ කරුණක් ලෙස දැක්විය හැක්කේ විශේෂ ස්ථාන සඳහා අලංකරණ අංග නිර්මාණයේ දී මා(ර්)බල් පාෂාණය යොදා ගැනීම ය. උදාහරණයක් ලෙස මිහින්තලේ උඩමළුවෙහි පිහිටි සේල චෛත්‍යයෙහි අලංකරණ අංගයක් වන සඳකඩ පහන නිර්මාණය කර ඇත්තේ ඉහතින් සඳහන් කළ මාබල් පාෂාණයෙනි.

මිහින්තලේ කැටයම් අතර කණ්ඨක චෛත්‍යයේ වාහල්කඩ වාස්තු විද්‍යාත්මක වශයෙන් වැදගත් නිර්මාණාංගයක් ලෙස හඳුනගත හැකි ය. වාහල්කඩ දෙපස ගල් කණු දෙක බැගින් දක්නට ලැබේ. එකී ගල්කණු මල්කම්, ලියකම්වලින් ද මිනිස් සහ සත්ත්ව (පක්ෂි සහ සිව්පා)රූපවලින් ද අලංකාර වී ඇත. නෙළුම් මල්, සිංහමුඛ, ඇත්හිස්, ලී ස්තර, පට්ටිකා, බොරදම් හා කැටයම් කුඩා ස්ථම්භවලින් අලංකාර කර ඇති ලක්දිව පැරණිත ම ගණදෙවි මූර්තිය ද මෙහි නිර්මාණය කොට තිබේ. ඉහතින් සඳහන් කැටයම් වැඩි ප්‍රමාණයක් නිර්මාණය කර ඇත්තේ මාබල් පාෂාණය භාවිතයෙනි. මෙසේ කැටයම් සඳහා මෙම පාෂාණය බහුල ලෙස යොදාගෙන ඇත්තේ එම පාෂාණයේ ඇති දීප්තිමත් බවත් සියුම් නිර්මාණයන් කිරීමට ඇති හැකියාවත් නිසා බව උපකල්පනය කළ හැකි ය. මිහින්තලේ පුරාවිද්‍යා භූමිය ආශ්‍රිතව සිදුකරනු ලැබූ මෙම පර්යේෂණයේ දී ඉදිකිරීම් සඳහා බහුල වශයෙන් ම නයිස් පාෂාණය යොදාගෙන ඇති බවත් කැටයම් සඳහා මාබල් පාෂාණය ද යොදාගෙන ඇති බවත් පෙන්වා දියහැකි ය.

### මුඛ්‍ය පද

පාෂාණ, පැරණි නටබුන්, ආරාම, මිහින්තලේ

### ආශ්‍රිත ග්‍රන්ථ

මහතන්තිල, කුෂානි සහ විතානගේ, මෙත්තිකා .,2005, *මිහිතලයේ නිර්මාපකයෝ ඛනිජ සහ පාෂාණ*, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

මනමේන්ද්‍ර ආරච්චි, කැළුම් නලින්ද සහ අධිකාරී ගාමිණී., 2014, *අනුරාධපුර පුරා ජෛව විවිධත්වය සහ වර්තමාන ජෛව විවිධත්වය*, ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය සහ පුනර් ජනනීය බලශක්ති අමාත්‍යංශය, බත්තරමුල්ල.

ලගමුව, ආරිය., 2014, *මිහින්තලේ පූජනීය සිද්ධස්ථාන හා පුරාවිද්‍යාත්මක ස්මාරක*, කතෘ ප්‍රකාශනයකි.

ලගමුව, ආරිය., 2009, *මිහින්තලේ කැටයම් මූර්ති හා බිතුසිතුවම්*, පර්යේෂණ සහ ප්‍රකාශන කමිටුව, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය.

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය , ශ්‍රී ලංකා ලරජරට විශ්ව විද්‍යාලයල ශ්‍රී ලංකාව ග